**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
**--------------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුලි 15 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ---------------------- |
| (i) | 2018 වර්ෂයේ එකතු වටිනාකම රු.5,083,769 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් සහ රු.39,204 කට මිලදී ගත් ලී බඩු සවි කිරීම් හා කාර්යාල උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදිව ප්‍රග්ධනිත කිරිමට කටයුතු කරමි. |
| (ii) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරිම වෙනුවට රු.2,092,359 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගැලපිය යුතු වේ. | 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී භෞතික තොගය ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.1,234,000 ක් වූ ඔරු අඟුල් 16 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතු වේ. | නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරමි. |

(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

| | | |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය , ඔප්පු හා පැවරුම් නියෝග , භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ඉන්වෙන්ට්‍රි ලේඛන නොමැතිවීම නිසා එකතුව රු.63,680,327 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කිරීම් කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ---------------------- |
| (i) | පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව අගලවත්ත ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු ලෙස රු.5,931,815 ක් දක්වා තිබූ අතර අගලවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව පාලින්දනුවර ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු රු.5,342,424 ක් හා පාලින්දනුවරට ගෙවිය යුතු රු.7,782,632 ක් දක්වා තිබුණි. මෙම ගනුදෙනු නිරාකරණය කර ගැනිමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගැනීමෙන් පසු ශේෂ නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | 2015 වර්ෂයේ සිට පැවත එන රු.622,055 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය නිරවුල් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | මෙම මුදල අතරුදවුමක් වන අතර ව්‍යාපෘතියේ අඩුපාඩු සකස් කරවාගෙන මෙම මුදල පියවීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

---------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | මුදල | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | ---------------------- | --------- | ----------- | ------------ | -------------------- |
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | - | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් | ප්‍රාදේශීය සභා පනත අනුව | නව හඳුනාගැනීම සඳහා උපලේඛන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (i) 134(1) වගන්තිය | | කරන ලද නිශ්චල දේපලවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | කටයුතු කල යුතු වේ. | සකස් කරමින් පවති. |
| | (ii) 160 වගන්තිය | - | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 16,760,000 | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරික්ෂා කිරිමට ලක් කර නොතිබුණි. | රිති ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරි වර්ෂ වලදී පරික්ෂා කිරිමට කටයුතු කරමි. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන චක්‍රලේඛය | - | වරිපනම් වලට අයත් වන දේපළ වසර 05 කට වරක් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | 2019 වර්ෂයේදී දේපල තක්සේරු කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,712,853 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,410,156 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,433,300 | 2,220,147 | 2,277,484 | 177,290 | 2,468,245 | 2,179,736 | 2,595,487 | 263,712 |
| (ii) | කුලී | 6,100,300 | 5,381,600 | 5,461,355 | 357,963 | 5.452,000 | 4,092,313 | 4,345,591 | 249,638 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 350,000 | - | 411,408 | - | 250,000 | - | 204,603 | - |
| (iv) | වෙනත් ආදායම් | 10,068,400 | 326,747 | 16,135,112 | 8,410,709 | 11,193,000 | - | 4,029,357 | 13,927,229 |

2.2.2 වරිපනම් බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් බදු හිඟ ආදායම රු.201,917 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.55,513 ක් හෙවත් සියයට 27 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදු ශේෂය තුල වර්ෂ 01 -03 දක්වා හිඟය රු.24,487 ක් ද , වර්ෂ 03-05 අතර හිඟය රු.18,992 ක් හා වර්ෂ 05 ට වැඩි හිඟය රු.42,456 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | දේපළ තහනමට ලක් කර හිඟ බදු මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ අක්කර බදු ආදායම රු.54,141 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.31,704 ක් හෙවත් සියයට 59 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂය තුළදී අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

(ඇ) වෙනත් ආදායම්

--------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ---------------------- |
| (i) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත පරිදි සභාවේ ලේකම්ගේ බලය ලබා නොගෙන 2018 වර්ෂයේ ප්‍රදර්ශනය කළ දැන්වීම් පුවරු 50 ක් වෙනුවෙන් රු.78,600 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි. | පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කර අදාල මුදල් අයකර ගත යුතුවේ. | මුදල් නොගෙවන ලද පුවරු ඉවත් කිරිමට කටයුතු කරමි. |
| (ii) | සභා බල ප්‍රදේශයේ ත්‍රිරෝද රථ නවතා තැබීමේ ස්ථාන වල නවතා තබන ත්‍රී රෝද රථ ලියා පදිංචි කරවාගෙන ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

(ඈ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ---------------------- |
| (i) උසාවි දඩ<br>----------- | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි උසාවි දඩ මුදල රු.900,000 ක් වු අතර වර්ෂය තුලදි ඉන් කිසිදු මුදලක් ලැබී නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.1,500,000 ක් බිල්කර තිබු අතර, 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.2,400,000 ක් විය. | හිඟ ආදායම අයකර ගත යුතුවේ. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (ii) මුද්දර ගාස්තු<br>------------- | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟහිටි මුද්දර ගාස්තු මුදල රු.13,000,000 ක් වු අතර එම හිඟයෙන් වර්ෂය තුල කිසිදු මුදලක් ලැබි නොතිබුණි. වර්ෂයට අදාල බිල් කිරිම රු.5,300,000 ක් වු අතර එම මුදලින් රු.9,990,000 ක අත්තිකාරමක් පමණක් වර්ෂය තුල ලැබි තිබුණි. ඒ අනුව 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.8,310,000 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | හිඟ ආදායම අයකර ගත යුතු වේ. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අතුරු ව්‍යවස්ථා<br>ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 06 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කල යුතු වේ. | ඉදිරියේදි අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කරමි. |
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම<br>2018 වර්ෂයේ අයවැයෙන් වෙන් කරන ලද රු.මි. 60.1 ක ප්‍රතිපාදනයන් සඳහා අක්මුදල් අවශ්‍යතාවය තීරණය කර අක් මුදල් සැලැස්මක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. මාර්ග හා සංවර්ධන වැඩසටහන් යටතේ සභා කර්මාන්ත ක්‍රියාත්මක කිරිම සඳහා අයවැයෙන් වෙන් කර තිබූ රු.1,200,000 ට අදාලව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුළ ව්‍යාපෘති හඳුනාගෙන නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදිව ක්‍රියාකාරි සැලැස්ම සකස් කල යුතු වේ. | 2019 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවට අනුව ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ක්‍රියා කිරිමට කටයුතු කරමි. |
| (ඇ) අයවැය ප්‍රතිපාදන ඉක්මවා ව්‍යාපෘති ඉටු කිරිම<br>සභා කර්මාන්ත සඳහා අයවැය ලේඛනයෙන් රු.මි.1.2 ක් වෙන් කලද රු.4,191,170 ක් කොන්ත්‍රාත් සමිති සඳහා ගෙවා තිබුණි. ඒ අනුව වැඩිපුර ගෙවා තිබුණු රු.2,991,170 වෙනුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදි වැඩිපුර ගෙවිම සඳහා අනුමැතිය ලබා ගැනිමට කටයුතු කරමි. |

(ඇ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

| | | |
|---|---|---|
| සණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් 2018 වර්ෂයේ රු.3,460,515 ක වියදමක් දරා තිබූ අතර දිරන කසළ සඳහා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඒ තුලින් 2018 වර්ෂයේ රු.218,784 ක ආදායමක් උපයාගෙන තිබුණ ද සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි කසළ එකතු කිරිම සිදු කර නොතිබුණි. | සණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව ඵලදායිව හා සඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමට කටයුතු කල යුතු වේ. | සභා බල ප්‍රදේශයම ආවරනය වන පරිදි කසල එකතු කිරිම හා වරිපනම් අය කිරිම සිදු නොකරයි. නව වරිපනම් කලාප ක්‍රියාත්මක කර කසල එකතු කිරිම පුළුල් කිරිමට කටයුතු කරමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් සභාව දැනුවත්ව සිටිය ද එකී සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. තවද ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2017 ජුලි 31 දිනැති අංක BD/CBP/4/1/2-2018 දරන චක්‍රලේඛය අනුව අයවැය ඇස්තමේන්තු සකස් කිරිමේදී හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති උපාය මාර්ග තුන පදනම් කර ගෙන නොතිබුණි. | අදාල චක්‍රලේඛ හා මග පෙන්වීම වලට අනුව කටයුතු කල යුතු වේ. | ඉදිරියේදි නිවැරදි ලෙස කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ------------------------------ |
| (ආ) | අගලවත්ත ප්‍රාදේශිය සභාව 2006 අප්‍රේල් 15 දින සිට පාලින්දනුවර හා අගලවත්ත යනුවෙන් ප්‍රාදේශිය සභා දෙකකට වෙන් වී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පාලින්දනුවර ප්‍රාදේශිය සභාවට හිමි විය යුතු වත්කම් හා වගකීම් බෙදා වෙන් කර ගැනීමට 2019 ජුනි 20 වන විටත් නොහැකි වී තිබුණි. | වත්කම් හා වගකිම් බෙදා ගැනිම හැකිතාක් ඉක්මනින් සිදු කල යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබාගෙන නිවැරදි කිරිමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 වර්ෂයේදී ඉරුදින ඌරු මස් විකිණීමේ ස්ථානයේ බදුකරු දිගින් දිගටම බදු මුදල් ගෙවීම පැහැර හැරීම නිසා ගිවිසුම අනුව රු.84,060 ක දඩ මුදලක් ලැබිය යුතුව තිබුණු අතර මෙම දඩ මුදල අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | දඩ මුදල් අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | මෙම හිඟය අයකර ගැනිමට සඳහා නඩු පවරා ඇත. |
| (ඇ) | 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය පරිපාලන) රීති 68 අනුව සභා බල ප්‍රදේශයේ පවතින සංවර්ධනය නොකරන ලද ඉඩම් සම්බන්ධයෙන් බදු පැනවීමක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් පරික්ෂණයක් සිදු කර ඇත. |

3.3 වත්කම් කළමනාකරණය
--------------------------

3.3.1 වත්කම් ලේඛනගත කිරිම
------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------ | -------------------------------- |
| සභාවට අයත් මාර්ග නිවැරදිව හඳුනාගෙන ඒවා ලේඛනයකට ඇතුළත් කිරිමේ හා ගැසට් කිරිමට අදාලව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ලේඛනගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |

3.3.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරිම
----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------ | ------------------------------------ |
| (අ) සභා කාර්යාලය හා මහජන පුස්තකාලය සහිත භූමියේ පිටුපස පර්චස් 10 ක පමණ භූමි ප්‍රමාණයක අනවසර පුද්ගලයෙකු වසර ගණනාවක සිට පදිංචි වී සිටී. | අනවසර පුද්ගලයින් ඉවත් කර සභාව සතු වත්කම් ආරක්ෂා කර ගත යුතුවේ. | 2019 වර්ෂයේ සිට මෙම ස්ථානය කුලියට දීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (ආ)2014 නොවැම්බර් මාසයේ දිවි නැගුම දෙපාර්තමේන්තුවෙන් ලද GI බටවලින් බට 264 ක් අස්ථානගතවී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | අදාල පාඩුව වගකිව යුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනිමට කටයුතු කල යුතුවේ. | පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් පරික්ෂණයක් සිදු කිරිමට කටයුතු කරමි. |

3.3.3 පවරා නොගත් වත්කම්

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල පවතින සුසානභූමි 32 න් 02 ක් පමණක් සභාව සතුව තිබූ අතර ඉතිරි සුසානභූමි 30 පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභා බල ප්‍රදේශය තුල පවතින සුසානභූමි පවරා ගැනිමට කටයුතු කල යුතුවේ. | සුසානභූමි පවරා ගැනිමට අවශ්‍ය මැණුම් කටයුතු සිදු කරමි. |

3.3.4 හඳුනාගත් අලාභ

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ හියුම් පයිප්ප මිලදී ගැනිමේදී තාක්ෂණික ඇගයීම් මිල කමිටු නිර්දේශ ලබා නොගැනීම හා අවම මිල ඉදිරිපත් කර ඇති සැපයුම්කරු තෝරා නොගැනීම හේතුවෙන් සභාවට රු.224,000 ක පාඩුවක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කල යුතුවේ. | ඉදිරියේදී හියුම් පයිප්ප මිළදී ගැනිම් සිදු කිරිමේදී තාක්ෂණික ඇගයිම් කමිටුවකට යොමු කර තීරණ ගැනීම සිදු කරන බවත් , ප්‍රසම්පාදන කමිටුවේ තීරණය මත මිලදී ගැනීම් සිදු නොකරන බවත් දන්වමි. |

3.4 ප්‍රසම්පාදනය

---------------

3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, අයවැය ලේඛනයෙන් ප්‍රාග්ධන වැය සඳහා වෙන් කල රු.මි.9.73 ක් වෙනුවෙන් විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂය සඳහා විධිමත් පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාව විසින් ඉදිකර තිබූ රු.මි.6.8 ක පිරිවැයක් වූ ව්‍යාපෘති 04 ක විධිමත් | කොන්ත්‍රාත් ගිවිසුම් අනුව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | |
|---|---|---|
| නිර්මාණ සකස් කර අනුමැතියකින් තොරව ඉදිකිරීම් සිදු කර තිබුණි. | | |
| (ආ) සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා සමිතියක් තෝරා ගැනීමේදී අදාළ කර ගත යුතු මූලික අවශ්‍යතා සලකා බැලීමකින් තොරව රු.මි.4.2 ක් වූ කොන්ත්‍රාත් 04 ක් සමිති වෙත පවරා තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කල යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) තාර දමා සංවර්ධනය කළ වලපිටිය කන්ද මාර්ගයේ ගල් මතුවී ගුණත්වය අඩු මට්ටමක පැවතියදී කොන්ත්‍රාත් සමිතිය වෙත රු.492,960 ක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් වෙනුවෙන් ගෙවීම් කිරිමට පෙර ඒවායේ ගුණත්වය නිවැරදිව භෞතිකව පරික්ෂා කර ගෙවීම් කල යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල කර තිබුණත් ඒ අනුව අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විධිමත්ව අභ්‍යන්තර විගණනය සැලසුම් කිරිම හා ක්‍රියාත්මක කිරිම කල යුතුවේ. | 2019 වර්ෂයේ සිට නිවැරදිව සිදු කිරිමට කටයුතු කරමි. |

### 4.2 පළාත් ගිණුම්කාරක සභාවේ තීරණ ක්‍රියාත්මක නොකිරිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 04 හා 11 යන දිනවල පැවති පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2011 විගණකාධිපති වාර්තාවේ 1.2 (ඇ), 1.3.3(i) , 1.3.3 (vi) , 1.5 , 1.6 (ii) , 2012 විගණකාධිපති වාර්තාවේ 2.1.1 (ඇ) , 2.2 (ආ)(i) , 2.2.4 (ආ) (ii) සහ 2013 විගණකාධිපති වාර්තාවේ 1.2.2 (ආ), 1.3.2 යන ජේද සම්බන්ධයෙන් දී තිබු නියෝග 2019 ජුනි 22 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කළ යුතු වේ. | අවශ්‍ය පරික්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව |